# අයවැය කථාව
# 2016

## ගරු සරත් ඒකනායක මැතිතුමා
## ප්‍රධාන අමාත්‍ය මධ්‍යම පළාත

2015 දෙසැම්බර් 14 වන දින
මධ්‍යම පළාත් සභාව, පල්ලෙකැලේ

# අයවැය කථාව 2016

ගරු සභාපතිතුමනි,

ගරු අමාත්‍යවරුනි,

ගරු විපක්ෂ නායකතුමනි,

ගරු මන්ත්‍රීතුමියනි,

ගරු මන්ත්‍රීතුමනි,

මධ්‍යම පළාත් සභාවේ හයවැනි පළාත් සභාවේ තෙවැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ මොහොතේ සහභාගිවී සිටින තමුන්නාන්සේලා සියළුදෙනාම ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමි. තමුන්නාන්සේලා සියළුදෙනාම දන්නා පරිදි මේවන විට අග්නිදිග ආසියාවේ කිසිම රටක දක්නට නොමැති දේශපාලන ක්‍රමයක් රටතුළ ස්ථාපිත වී ඇත. බොහෝ දේශපාලන පක්ෂ, විවිධ ජාතින්, මැතිවරණයකින් ජයග්‍රහණය කළ දේශපාලන පක්ෂ මෙන්ම ප්‍රමාණවත් ඡන්ද ලබා නොගත් අපේක්ෂකයන් ද එකතු කරගනිමින් රට තුළ යහපාලනයක් ඇතිකරලීමේ අරමුණ ඇතිව රජය පිහිටුවා ඇත.

පළාත් සභා ක්‍රමය මෙරටට හඳුන්වාදුන් දා සිටම පළාත් මට්ටමින් ප්‍රාග්ධන ආයෝජනය බෙදාහැරිය නමුත් 2016 වසරේ සිට දිස්ත්‍රික් අනුව ප්‍රාග්ධන අරමුදල් ලබාදීමට තීරණය කර ඇත. මෙයට හේතුව වී ඇත්තේ ඇතැම් පළාත් සභා විසින් සමහර දිස්ත්‍රික්වලට කරන ලද ප්‍රාග්ධන ආයෝජනය සෑම වසරකදීම අඩු අගයක්වීම වළක්වා ගැනීම සඳහාය. එක් එක් දිස්ත්‍රික්කවල ඇති සුවිශේෂි තත්ත්වයන් සහ වාසි පදනම් කරගනිමින් ආයෝජනය කිරීමෙන් ජනතාවට රැකියා අවස්ථා බිහිවීම ජනතාවගේ ආදායම වැඩිවීමත් සමග රටේ දළ ජාතික නිෂ්පාදනය වැඩිවීම සහ සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට හැකියාව ඇත. එපමණක් නොව ප්‍රාදේශීය සංවර්ධනයට ද පිටුවහලක් වනු ඇත.

ගරු සභාපතිතුමනි,

මෙවර අයවැය ඉදිරිපත් කිරීමේ දී පැරණි ක්‍රමයට වඩා ප්‍රධාන වෙනස්කම් දෙකක් අනුගමනය කිරීමට සිදුවී ඇත. ඉන් පළමුවැන්න වන්නේ සම්ප්‍රදායික

අයවැය ක්‍රමයට නොව ශුන්‍යපාදක ක්‍රමය අනුගමනය කිරීමට සිදුවීමයි. ඇත්ත වශයෙන්ම මෙම ක්‍රමය ඇමෙරිකා එක්සත් ජනපදයේ පුද්ගලික ආයතනයක් විසින් ප්‍රථමයෙන්ම හඳුන්වා දී ඉතා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇත. එමනිසා ලෝකයේ බොහෝ රාජ්‍යයන් මෙම ක්‍රමය රාජ්‍ය අයවැය සකස් කිරීමේදී ද භාවිතා කරනු ලැබේ. මෙම ක්‍රමය තුළින් යම්කිසි ව්‍යාපෘතියක් ඇස්තමේන්තු කිරීමේදී නිවැරදිව ඇස්තමේන්තු කළයුතු අතර, එමනිසා විමර්ශන කටයුතු ද ඉතා පහසුවෙන් කළහැකි වේ. එමගින් රාජ්‍ය මුදල් අවභාවිතයෙන් තොරව නිවැරදිව වැය කිරීමට ඉඩ ප්‍රස්ථා සැළසේ.

දෙවැන්න වූයේ මෙතෙක් කල් මහාභාණ්ඩගාරය සෑම පළාත් සභාවක් සඳහාම වැය ශීර්ෂයක් ලබාදී කෙළින්ම පළාත් සභාවට මුදල් දීමේ ක්‍රමය වෙනස් කර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හරහා පළාත් සභාවට මුදල් ලබාදීමයි. මෙම ක්‍රමය පළාත් සභාවට අහිතකර මෙන්ම පළාත් සභා ක්‍රමය ගෙනයාමට බාධාවක් බව අතිගරු ජනාධිපතිතුමාට පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් විසින් පෙන්වා දුන් පසු අතිගරු ජනාධිපතිතුමා විසින් පැරණි ක්‍රමයට ම මුදල් ලබාදෙන බවට පොරොන්දු විය. අපගේ ඉල්ලීමට ඇහුම්කන් දෙමින් වැරදි ක්‍රමය නිවැරදි කිරීමට එකඟ වූ අතිගරු ජනාධිපතිතුමාට අපගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමු.

නව රජය බලයට පත්වීමෙන් පසු රටේ දැඩිව පවතින ගැටළු කිහිපයක් හඳුනාගෙන ප්‍රධාන වැඩසටහන් 4කට ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමට සැලසුම් කර ඇත. එම ප්‍රමුඛතාවයන් වන්නේ,

1. වස විසවලින් තොර දේශීය ආහාර නිෂ්පාදනය
2. වකුගඩු සහ ඩෙංගු රෝගය මුලිනුපුටා දැමීම හා ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම
3. මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම
4. පරිසරය සංරක්ෂණය කරමින් රටේ වන ගහනය ශ්‍රී ලංකා භූමියෙන් 32% දක්වා වැඩි කිරීම

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අප පළාත් සභාවද අනුගත වෙමින් ක්‍රියාකළ යුතු අතර, මින් ඉදිරියට මේ සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමට අපට සිදුවේ.

ගරු සභාපතිතුමනි,

මම මෙතැන් පටන් අප පළාත් සභාවට 2016 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව හරහා මහභාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිත ප්‍රදානයන් හා එම ප්‍රදානයන් බෙදා දීමට නියමිත ආකාරය දැක්වීමට සුදානම් වෙමි.

| **ආදායම් හා ප්‍රදානයන් පුරෝකථනය** | **රු.මිලියන** |
|---|---|
| සාමූහික ප්‍රදාන | 23,374.837 |
| රජය මගින් ලබාදෙන ආදායම | 3,294.000 |
| පළාත් ආදායම් ඉලක්කය | 1,450.000 |
| (මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර) | |
| පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු ආදායම | |
| මුද්දර ගාස්තු | 1,200.000 |
| උසාවි දඩ | 100.000 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,684.300 |
| උපමාන පාදක ප්‍රදාන | 423.000 |
| විදේශාධාර | 1,067.040 |
| **එකතුව** | **34,593.177** |

මෙම සාමූහික ප්‍රදානයන් තුළ රු.මි. 2,731.5 ක මුදලක් වැටුප් ප්‍රතිපූර්ණය හා මන්ත්‍රී දීමනා වෙනුවෙන් පළාත් පාලන ආයතනවලට මාරු කළ යුතු අතර ගරු හිඟ වැටුප් මෙම වසර තුළ ගෙවා අවසන් කිරීම සඳහා රු.මි. 700.0 ක මුදලක් වෙන් කරනු ලැබේ.

**වියදම් පුරෝකථනය**

| | රු. මිලියන |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | 5,174.340 |
| පුනරාවර්ථන වියදම් | 29,418.837 |
| | **34,593.177** |

පුනරාවර්ථන වියදම් පහත සඳහන් පරිදි වෙන් කෙරෙනු ඇත.

| | රු. මිලියන |
|---|---|
| ආණ්ඩුකාරවර හා කාර්ය මණ්ඩලය | 14.520 |
| සභා ලේකම් කාර්යාලය | 51.094 |
| ප්‍රධාන අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 31.201 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2,700.000 |
| සෞඛ්‍ය අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 13.688 |
| මාර්ග අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 16.219 |
| කර්මාන්ත අමාත්‍ය හා කාර්ය මණ්ඩලය | 13.789 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 14.186 |
| පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් වියදම් | 26,564.140 |
| **එකතුව** | **29,418.837** |

මෙම ප්‍රාග්ධන වියදම් තුළ විදේශාධාර වශයෙන් රු.මි. 1067.04 ක් ලැබෙන අතර එම මුදල එම ව්‍යාපෘති සඳහාම වැය කළ යුතුය. ඉතිරි මුදල වන රු.මි. 4107.30 ක මුදල පළාතේ සංවර්ධන කටයුතු සඳහා ඒ ඒ විෂයයන් සඳහා අදාළ අමාත්‍යංශ වෙත ලබාදීමට නියමිතය.

ගරු සභාපතිතුමනි,

ප්‍රාග්ධන වියදම් වශයෙන් ලැබෙන මුදල 2015 වර්ෂයට වඩා රු.මි.795 කින් වැඩි කර ඇත.

**අධ්‍යාපනය**

ගරු සභාපතිතුමනි,

අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව වශයෙන් අප අදහස් කරන්නේ දරු දැරියන් විභාගවලින් සමත් කරලීම පමණක් නොව ඔවුන් සමාජයේ යහපත් පුරවැසියන් බවට පත් කරලීමයි. මේ සඳහා පාසල් අධ්‍යාපනය මෙන්ම වෘත්තීය අධ්‍යාපනය ද ලබාදිය යුතුය. අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබාදීම අපගේ කාර්යභාරය වන අතර පසුගිය වර්ෂයේ දී භෞතික සම්පත් වශයෙන් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම, ගුරු නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම, පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම, විදුලිය ලබාදීම, ඩෙස් පුටු ලබාදීම වැනි කාර්යයන් ඉටු කළ අතර මානව සම්පත් වශයෙන් සිංහල මාධ්‍යයෙන් ගුරුවරුන් 1021 ක් ද, දෙමළ මාධ්‍යයෙන් 1074 ක් ද බඳවා ගන්නා ලද අතර, මින් වැඩිම සංඛ්‍යාව එනම් 1274 ක් නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වේ. මීට අමතරව ගුරු සේවයේ උසස්වීම් 1174 ක් ලබාදී අධ්‍යාපනය ඉහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කර ඇත.

2016 වර්ෂයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ භෞතික සම්පත් තවදුරටත් පුළුල් කිරීම සඳහා රු.මි. 1,250 ක් වෙන්කර දීමට යෝජනා කරන අතර, මීට අමතරව ලෝක බැංකු ආධාර යටතේ තවත් රු.මි. 430 ක් ද යුනිසෙෆ් ආධාර යටතේ රු. මි. 24.04 ක් ද ලබාදෙනු ඇත. මේ අනුව 2015 වර්ෂයට වඩා 2016 වර්ෂයේදී රු.මි. 1,095 ක් (200% ක්) වැඩිපුර අධ්‍යාපනය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් ආයෝජනය කරනු ඇත.

**ඉඩම් සංවර්ධනය**

පළාත් සභාව තුළ රජයේ ආයතන සතු ඉඩම් නිරවුල් කරගැනීමටත්, අනවසරයෙන් පදිංචි වී සිටිනම් ඒවා නිරවුල් කරගැනීමටත් ඉඩම්වලට අවශ්‍ය නීති රීති ක්‍රියාවට නැංවීමටත්, ඉඩම් දත්ත බැංකුව යාවත්කාලීන කිරීමටත්, ආයෝජනයන් පැමිණීමේදී ඊට සුදුසු ඉඩම් තෝරා වෙන්කර ගැනීමටත් කටයුතු කරනු ලබන අතර ඒ සඳහා රු.මි. 5.0 ක් වෙන්කර දීමටත් යෝජනා කරමි.

## ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පළාත් පාලන ආයතනවල මූලික වගකීමක් වේ. විශේෂයෙන්ම නාගරිකරනය සහ ජනාවාස බිහිවීම වැනි හේතූන් නිසා වර්තමානයේ ජනනය වන කැළි කසළ ප්‍රමාණය බෙහෙවින් ඉහළ ගොස් ඇත. මෙම කැළි කසළ කළමනාකරණය සඳහා ඒවා සුදුසු තැන්වලට ප්‍රවාහනය කිරීමත්, එමගින් කොම්පෝස්ට් පොහොර නිපදවීමත්, නිවෙස්වල එකතුවන කැළි කසළ නිවසේදීම කොම්පෝස්ට් නිපදවීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත් කළ යුතුවේ. මෙම වැඩසටහන් දිගින් දිගටම ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ සඳහා රු.මි. 55 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

ජනගහනය වැඩිවීම, ජනාවාසා බිහිවීම වැනි හේතූන් නිසා අතීතයේ මෙන් සුසාන භූමි ඉදිකිරීමට ඉඩකඩ නොමැතිවීම නිසා පළාත් පාලන ආයතන මගින් ආදාහනාගාර ඉදිකිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස මම දකිමි. එමනිසා නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල පවතින සුසාන භූමිවල අදාහනාගාර ඉදිකිරීම හා ග්‍රාමීය ප්‍රදේශවල නිපදවන එළවළු පලතුරු ආදී කෘෂි නිෂ්පාදන මෙන්ම අනිකුත් නිෂ්පාදන ගොවියාට පහසුවෙන් අළෙවි කර ගැනීම සඳහාත්, වර්තමානයේ ග්‍රාමීය නිෂ්පාදනයන් කෙරෙහි පාරිබෝගිකයන්ගේ නැඹුරුවක් පවතින හෙයින් සති පොළ සංවර්ධනය කිරීම වැදගත් වේ. එමනිසා සුදුසු ස්ථානයන්හි සති පොළවල් සංවර්ධනය කර නිෂ්පාදකයන්ට මෙන්ම පාරිභෝගිකයන්ට ද පහසුවන පරිදි සති පොළ සංවර්ධනය කිරීම වැනි සේවාවන් සැපයීම සඳහා රු.මි. 25 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## පානීය ජලය

වර්තමානයේ බොහෝ ජල මූලාශ්‍ර අපවිත්‍ර වි ඇත. එම ජලය ප්‍රයෝජනයට ගැනීමෙන් විවිධාකාර සෞඛ්‍ය ගැටළුවලට ජනතාවට මුහුණ දීමට සිදුවේ. එමනිසා පිරිසිදු පානීය ජලය ලබාදීම අපගේ යුතුකමක් වේ. නව පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අක්‍රීය ජල ව්‍යාපෘති ප්‍රති සංවර්ධනය කිරීම, ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම, ප්‍රජාමූල සංවිධාන සවිබල ගැන්වීම වැනි කටයුතු ඉටු කිරීම සඳහා රු.මිලියන 50 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

### පළාත් පාලන මාර්ග සංවර්ධනය

පළාත් පාලන ආයතන මගින් නිසි ප්‍රමිතියෙන් යුතු මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කර ඇතත් පළාතේ භූ විෂමතාවය, කාලගුණ තත්ත්වයන් හේතුකොටගෙන මාර්ග දිනෙන් දිනම දුර්වල තත්ත්වයට පත්වේ. මේනිසා මාර්ග නිරන්තරයෙන්ම අලුත්වැඩියා කිරීමටත්, නඩත්තු කිරීමටත් සිදුවේ. විශේෂයෙන්ම ජනතාව දේශපාලන අධිකාරියෙන් ඉල්ලා සිටින්නේ ද මාර්ග අලුත්වැඩියා කරදෙන ලෙසය. එමනිසා බස් ධාවනය කරන මාර්ගවලට ප්‍රමුඛත්වය දෙමින් පළාත් පාලන මාර්ග සංවර්ධනය සඳහා රු. මිලියන 110 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

### පූර්ව ළමාවිය සංවර්ධනය

යහපත් පරිපූර්ණ පුද්ගලයකු රටට දායාද කරදීමට නම් පුද්ගලයෙකු කුඩා කළ සිටම යහ මඟට යොමු කළ යුතු වේ. පූර්ව ළමාවිය අධ්‍යාපනය ලබාදීම සඳහා පවත්වාගෙන යන සමහරක් පෙර පාසැල් නිසි ප්‍රමිතියකින් තොරය. ඒවාහි අධ්‍යාපනය ලබාදෙන උපදේශිකාවන්ට නියමිත අධ්‍යාපනයක් හෝ පුහුණුවක් නොමැත. එමනිසා පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වෙනම ඒකකයක් පිහිටුවා එමගින් පූර්ව ළමා වියේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම, ඔවුන්ගේ කායික හා මානසික සංවර්ධනය, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, මේ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන ලියාපදිංචි කිරීම, පූර්ව ළමාවියේ පසුවන දරුවන් පුහුණු කරන ආයතන ගුණාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහ උපදේශිකාවන් පුහුණු කිරීම ආදි කටයුතු රාශියක් ඉටු කිරීමට සිදිවේ. විශේෂයෙන් අප පළාත් සභාව මගින් සම්මත කර ගන්නා ලද පූර්ව ළමාවිය ප්‍රඥප්තිය අනුව කටයුතු කිරීම මෙම ඒකකයයේ කාර්යභාරය වේ. මේ සඳහා රු.මි. 5.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

### සංස්කෘතික කටයුතු

මධ්‍යම පළාත යනු සංස්කෘතික අතින් ඉතා වැදගත් පළාතකි. පැරණි සිද්ධස්ථාන රාශියක් ද, ඉපැරණි දේවස්ථාන, කෝවිල්, මුස්ලිම් පල්ලි වැනි මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් ද ඇත. එමෙන්ම පැරණි ජනශ්‍රැති, නැටුම් ගැයුම් වැනි වටිනාකම්

ඇති අගයන් සුරැකිව අනාගත පරපුරට දායාද කිරීමට අප කටයුතු කළ යුතුවේ. පසුගිය වර්ෂයේදී මහනුවර අවට තිබෙන දේවාලයන්හි පෙරහැරවල් වීඩියෝගත කර ආරක්ෂා කිරීමට කටයුතු කළෙමු. මේ හා සමාන කටයුතු ඉදිරියේදී ද සිදුකිරීමට අපේක්ෂිත අතර බෞද්ධ හා සිංහල, මුස්ලිම් සංස්කෘතික කටයුතු වෙනුවෙන් රු.මි. 8.0 ක්ද, හින්දු සංස්කෘතික කටයුතු වෙනුවෙන් රු.මි. 1.0 ක් ද වෙන්කර දීමට යෝජනා කරමි.

**සංචාරක, වෙළඳ හා වාණිජ කටයුතු**

2015 වර්ෂයේ මේවන විට මධ්‍යම පළාතට සංචාරකයින් ලක්ෂ 2.8 ක් පැමිණ ඇත. මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලට මෙයින් වැඩි ප්‍රමාණයක් පැමිණ ඇති අතර, මහනුවර නැවතී ඇත්තේ ඉන් අතලොස්සකි. එපමණක් නොව දේශීය සංචාරකයන් ද විශාල වශයෙන් මධ්‍යම පළාතට පැමිණ ඇත. මධ්‍යම පළාත තුළ සංචාරක වශයෙන් වැදගත් ස්ථානවල පවතින පහසුකම් එතරම් ආකර්ශනීය තත්ත්වයක නොපවතී, සංචාරකයන්ගේ පැමිණීම නිසා දේශීය කුඩා කර්මාන්ත නිෂ්පාදනයන් අළෙවි කර හොඳ ආදායම් උපයා ගැනීමට හැකියාව ඇත. මෙම කුඩා කර්මාන්ත තවදුරටත් දියුණු කිරීමටත් සංචාරක ආකර්ශනීය ස්ථානවල අඩුපාඩු සම්පූර්ණ කර දේශීය, විදේශීය සංචාරකයන් මධ්‍යම පළාතට ගෙන්වා ගැනීමට කටයුතු කරනු ඇත. එපමණක් නොව මධ්‍යම රජයේ සංචාරක අමාත්‍යාංශයේ ආධාර උපකාර ලබාගෙන පළාතේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත්, මධ්‍යම පළාත වෙනුවෙන් සකස් කර ඇති සංචාරක සැලැස්මේ කටයුතු ද ක්‍රියාත්මක කර සංචාරක ව්‍යාපාරය තුළින් මධ්‍යම පළාතේ ආදායම වැඩිකිරීමටත්, රැකියා අවස්ථා සළසා දීමටත් කටයුතු කරනු ඇත.

විදේශීය සංචාරකයන්ගේ පැමිණීම වසරින් වසර වැඩි වෙමින් පවතින හෙයින් ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීමටත්, ගෘහස්ථ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත්, පාරිසරික සංචාරක කර්මාන්තය හා ප්‍රජා සංචාරක කර්මාන්තය දියුණු කර ග්‍රාමීය ජනතාවට ප්‍රතිලාභ අත්කර දීමටත් කටයුතු කරනු ඇත. එමෙන්ම වෙළඳ හා වාණිජ කටයුතු ද දිරිමත් කළ යුතුව ඇත. පළාතේ වෙළඳ ප්‍රජාව රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් කරනු ලබනවා සේම පළාත් ආදායමටද විශාල බලපෑමක් කරනු ලැබේ. වෙළඳ ප්‍රජාව ශක්තිමත් කිරීමට කටයුතු කිරීම හා ඔවුන්ගේ ව්‍යාපාර නාම ලියාපදිංචි කර

ඔවුන්ට ස්ථිරතාවයක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. වෙළඳ ව්‍යාපාර ලියාපදිංචි කර නොමැති ආයතන ලියාපදිංචි කර පළාතට ආදායම් උපයා ගැනීමටත් කටයුතු කරනු ලැබේ. සංචාරක වෙළඳ හා වාණිජ කටයුතු වෙනුවෙන් රු.මි. 60 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## පුස්තකාල සංවර්ධනය

මධ්‍යම පළාතේ පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය අප පළාතේ විශේෂත්වයක් දරන ආයතනයකි. එහි අධ්‍යාපනය ලබන දරුවන් මෙන්ම වැඩිහිටි පුරවැසියන් ද එමගින් දැනුම ලබා ගනු ලැබේ. එම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් ලෙස පවත්වා ගැනීම සඳහාත්, නවීන පොත් පත් සඟරා මිලදී ගැනීම සඳහාත් රු.මි. 4.5 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## සෞඛ්‍ය සේවා

සෞඛ්‍ය අංශයෙන් අප බලාපොරොත්තු වන්නේ නිරෝගි කාර්යශූර ජනතාවක් බිහිකර ගැනීමයි. මේ සඳහා බෝවන රෝග මෙන්ම බෝ නොවන රෝග වැළඳීම අවම කරගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. එමෙන්ම මීට පෙර අප ඉලක්ක කරගත් ආකාරයට 2016 වන විට ළදරු මරණ අනුපාතය 4 (සජීවී උපත් 1000කට)දක්වාත්, මාතෘ මරණ අනුපාතය 12 (සජීවී උපත් 100,000කට) දක්වාත් අවම කරගැනීමට කටයුතු කළ යුතුය. තවද රට තුළ පැතිරී යන ඩෙංගු, ජලභීතිකාව, මී උණ, වකුගඩු වැනි රෝග ව්‍යාප්තිය අවම කරගැනීමටත් කටයුතු කළ යුතුය. මේ සඳහා පළාතේ රෝහල්වල අඩුපාඩු සොයාබලා ඒවාට අවශ්‍ය පිළියම් යෙදවීමටත් කටයුතු කරන අතර, විශේෂයෙන්ම රෝහල්වල අලුත්වැඩියා කටයුතු, සනීපාරක්ෂක කටයුතු සම්පූර්ණ කර මහජනතාවගේ ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කිරීම අවශ්‍ය වේ. බටහිර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඒකාබද්ධ අරමුදල මගින් රු.මි. 795.0 ක් ද ලෝක බැංකු ආධාර යටතේ රු.මිලියන 365 ක් ද වෙන් කර දීමට යෝජනා කරන අතර පසුගිය වර්ෂයේ දී ආරම්භ කරන ලද තෙල්දෙණිය මූලික රෝහලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා JICA ආධාර යටතේ රු.මි.248 ක් ද වෙන් කෙරෙනු ඇත.

## ආයුර්වේද වෛද්‍ය කටයුතු

දේශීය වෛද්‍ය ක්‍රමය කෙරෙහි ජනතාවගේ උනන්දුව වැඩි වෙමින් පවති. දේශීය වශයෙන් පමණක් නොව විදේශීය රෝගීන්ද ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය ලබාගැනීමට පැමිණේ. ඔවුන්ට එම සේවාවන් උපරිම ආකාරයෙන් ලබාදීමත්, අභාවයට යමින් පවතින සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සොයාබලා පර්යේෂණ පවත්වා ඒවා නගාසිටුවීමටත්, අපට අවශ්‍ය ඖෂධ පළාත තුළින්ම නිපදවා ගැනීමටත්, ඖෂධ සඳහා අවශ්‍ය ඔසු වර්ග දේශීය වශයෙන් වගාකර පිටරටට ඇදී යන විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කරගැනීමටත් බලාපොරොත්තු වන අතර, දැනට විශාල ඉල්ලුමක් පවතින ගෙවන වාට්ටු ප්‍රමාණය වැඩිකර මහජනතාවට අවශ්‍ය සේවාව ලබාදීමටත් කටයුතු කරනු ලැබේ. දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා පෙර වර්ෂයට වඩා 400% ක් එනම් රු.මි. 120 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## පරිවාස කටයුතු

දෙමව්පියන් නිසා හෝ සමාජයේ විවිධ පුද්ගලයන් නිසා අසරණභාවයට පත්වන දරුදැරියන් රැකබලා ගැනීමත් ඔවුන්ට නිසි අධ්‍යාපනයක් ලබාදී සමාජයේ යහපත් පුරවැසියන් බවට පත් කිරීමත් අපගේ යුතුකමකි. දරුවන් හැරයන, දෙමාපියන් නොමැති දරුවන්ට රැකවරණය ලබාදීම, නොයෙකුත් අපචාර කටයුතු නිසා අධිකරණය මගින් පරිවාසගත වන දරුවන්ට නිසි රැකවරණය ලබාදීම ආදී කටයුතු සහ ඔවුන්ට සමාජයේ අනෙකුත් දරුවන් මෙන් ජීවත්වීමට හැකිවන පරිදි අවශ්‍ය පරිසරයක් සපයා දීම අපගේ යුතුකමකි. මෙම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 15 ක් වෙන්කර දීම සුදුසු යැයි මම යෝජනා කරමි.

## සමාජ සේවා කටයුතු

වැඩිහිටි පුද්ගලයන්ට සැළකීම, අසරණයන්ට පිහිටවීම පිළිබඳ බුද්ධ දේශනාවේද සඳහන් වී ඇත. ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය ක්‍රමයෙන් ඉහළ යන මට්ටමක පවතින බව එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් පෙන්වා දී

ඇත. 2025 වන විට සෑම පුද්ගලයන් පස්දෙනෙකුටම වයස අවුරුදු 60 හෝ ඊට වැඩි පුද්ගලයන් එක් අයෙකු සිටීමේ තත්ත්වයන් දැකිය හැකිවනු ඇත. වයස්ගත ජනගහනයේ නිරපේක්ෂ සංඛ්‍යාව හා නිරන්තරයෙන් වැඩිවන ප්‍රතිශතය සමග ග්‍රාමීය ප්‍රදේශවල හා නාගරික ප්‍රදේශවල එකිනෙකට වෙනස් තත්ත්වයන් දකින්නට ලැබේ. ග්‍රාමීය ප්‍රදේශවල වයස්ගත ජනගහනය වැඩිවන අතර ඔවුන් රැකබලා ගන්නේ පවුලේ සාමාජිකයන් විසින්ය. නාගරික ප්‍රදේශවල වයස්ගත පුද්ගලයන්ගේ ප්‍රතිශතය අඩු බවක් දක්නට ලැබෙන අතර ඔවුන් බොහොමයක් ආයතනගතවී ප්‍රජාව විසින් රැකබලාගනු ලැබේ. එමනිසා ග්‍රාමීය ප්‍රදේශවල පවුලේ ආදායම වැඩිකර ගැනීමටත් නාගරික ප්‍රදේශවලදී රජය විසින් හා ප්‍රජාව විසින් ඔවුන් රැකබලා ගැනීම සෞඛ්‍ය සම්පන්නව තබාගැනීම ඔවුන්ගෙන් සමාජයට යමක් කළ හැකි පුද්ගලයන්ගෙන් ප්‍රයෝජන ලබාගැනීමටත් වැඩසටහන් සම්පාදනය කළ යුතුවේ.

වැඩිහිට පුද්ගයන්ගේ සංස්කෘතික දැනුම ඔවුන්ගේ අත්දැකීම්, දැනුම ප්‍රයෝජනයට ගනිමින් නවීන පරපුරට අධ්‍යාපනයන් ලබාදීමට කටයුතු කළ යුතුවේ. එපමණක් නොව වැඩිහිටි පුද්ගලයන්ට ඇස් කන්ණාඩි ලබාදිම, අලි මිනිස් ගැටුම මත අසරණභාවයට පත්වන පුද්ගලයන්ට සරණ වීම, නොයෙකුත් ආබාධිත තත්ත්වයන්ට පත් වූ පුද්ගලයන්ට පිහිට වීම, ස්වභාවික විපත්වලට මුහුණපාන පුද්ගලයන්ට පිහිට වීම ආදී නොයෙකුත් සමාජසේවා කටයුතු වෙනුවෙන් රු.මි. 17 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## කෘෂිකර්මාන්තය

කෘෂිකර්ම සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කිරීමෙන් අප බලාපොරොත්තු වෙන්නේ කෘෂි නිෂ්පාදනයන් වැඩි කිරීම, ඒ සඳහා ව්‍යාප්ති සේවාව වැඩිදියුණු කිරීම ගොවින්ට අවශ්‍ය බීජ නිෂ්පාදනය කිරීම ආදි කටයුතුය. විශේෂයෙන්ම මධ්‍යම පළාතට පමණක් නොව ඌව පළාතට ද අවශ්‍ය බෝංචි බීජ නිෂ්පාදනය කරනු ලබන්නේ මධ්‍යම පළාත තුළය. එමෙන්ම බීජ අල නිෂ්පාදනය, ලොකු ළූණු බීජ නිෂ්පාදනය කිරීම තුළින් උසස් වර්ගයේ බීජ නිෂ්පාදනය කර ගොවීන්ට අවශ්‍ය බීජ අප පළාත තුළම නිපදවීම අපගේ අරමුණයි. තව ද ගෙවතු වගාව දිරිමත් කිරීම තුළින් ගෘහස්ථ එළවළු පලතුරු නිෂ්පාදනය කිරීමට නිවැසියන්

පෙළඹවීම අපගේ තවත් අරමුණකි. එමගින් පවුලේ පෝෂණය නගාසිටුවීමටත් පවුලේ වියදම අඩුකර ගැනීමටත් උනන්දු කරනු ලැබේ.

අපගේ පැරණි වී වර්ගවලින් ලැබෙන අස්වැන්න නවීන දෙමුහුන් වී වර්ගවලින් ලැබෙන අස්වැන්නට වඩා අඩු වුවත් එහි වියදම අඩුවන හෙයින් ආදායමේ වෙනසක් සිදු නොවේ. එහෙයින් පැරණි වී වර්ග භාවිතය, කෙම් ක්‍රම වැනි කෘමිනාෂක ක්‍රම අනුගමනය කර ගුණාත්මක සහල් නිපදවීමට ගොවීන් හුරු කිරීමට කටයුතු කරනු ලැබේ. එමගින් වස විසෙන් තොර ආහාර නිපදවා ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කර බෝ නොවන රෝග වළක්වා ගැනීමට ද හැකිවනු ඇත.

එපමණක් නොව අපනයන වෙළඳපළ මුල් කරගනිමින් පලතුරු, මල්, එළවළු ආදි බෝග වාණිජ පදනම මත වගා කිරීම සඳහා කුඩා පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීමටත්, පුරන් කුඹුරුවල විකල්ප බෝග වගා කිරීම දිරි ගැන්වීමටත් කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 230 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි,

කෘෂිකාර්මික ඇතැම් ප්‍රදේශවල මාර්ග පද්ධතිය ඉතා දුර්වලය. කෘෂි නිෂ්පාදනවලට හානියක් සිදු නොවී ප්‍රවාහනය කිරීම සඳහාත්, පොහොර, බීජ වර්ග ප්‍රවාහනය කිරීම සඳහාත් කෘෂි මාර්ග සංවර්ධනය කළ යුතු හෙයින් ඒ සඳහා රු. මිලියන 30.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

එපමණක් නොව ගරු සභාපතිතුමනි, වතු අංශයේ පවතින මාර්ග ද නඩත්තු කර දීම අපගේ වගකීමකි. කුඩා තේ වතු, පෞද්ගලික තේ වතු මගින් විශාල ආදායමක් රටට ලබා දේ. විශේෂයෙන්ම වතුකරයේ නිෂ්පාදනය කරනු ලබන එළවළු, පලතුරු කිරි ආදි නිෂ්පාදන වෙළඳපලට රැගෙන ඒම සඳහා වතු මාර්ග සංවර්ධනය කළ යුතුවේ. එහිදී මාර්ග රාශියක් තෝරාගෙන කොටස් වශයෙන් සංවර්ධනය කරනවා වෙනුවට මාර්ග සුළු ප්‍රමාණයක් තෝරාගෙන සම්පූර්ණයෙන් නිම කිරීම වඩා වැදගත්වේ. වතු මාර්ග සංවර්ධනය සඳහා රු.මි. 30 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## සුළු වාරිමාර්ග

අප පළාතේ තිබෙන වැව්, අමුණු හා ඇලවල් විශාල ප්‍රමාණයක් මේ වන විට යථා තත්ත්වයට පත් කර ඇති බව සතුටින් දන්වන අතර අධික වර්ෂාව නිසා කැඩී බිඳී ගිය වැව් අමුණු මෙන්ම දිගු කාලයක් තිස්සේ අලුත්වැඩියා කිරීමට නොහැකි වූ සුළු වාරිමාර්ග රාශියක්ද පවතී. ගොවියාට අවශ්‍ය ජලය කලට වේලාවට ලබාදීම, එක් ඒකකයකින් ලැබෙන ඵලදාව උසස් කිරීම හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය කිරීමට දායකවීම අරමුණු කරගනිමින් සුළු වාරිමාර්ග සංවර්ධනය සඳහා රු.මි.35 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු

ඈත අතීතයේ සිටම අප රට ජනතාවට පෝෂණය ලබාදී ඇති එක් මාර්ගයක් වූයේ සත්ත්ව නිෂ්පාදනයයි. අද මෙන් ඉහළ ඵලදාවක් ලබාදෙන සතුන් එකල නොසිටියෙන් සෑම නිවසකම පාහේ සතුන් ඇති කළ හෙයින් විශාල සත්ත්ව ගහණයක් එකළ වූ හෙයින් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ජනතාවගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවිය.

මධ්‍යම පළාතේ කිරි නිෂ්පාදනය ජාතික නිෂ්පාදනයෙන් 32% ක් බව ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව පෙන්වා දෙයි. ඒ පිළිබඳව අපට සතුටු විය හැකිය. විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ මේ පිළිබඳව හොඳ විභවතාවයන් පවතින හෙයින් කිරි ගොවීන්ගේ සංඛ්‍යාව පමණක් නොව උසස් ආරයේ කිරි දෙනුන්ගේ සංඛ්‍යාව ද වැඩිකර අපට අවශ්‍ය කිරි ප්‍රමාණය අප විසින්ම නිපදවා විදේශයට ගලායන විනිමය ප්‍රමාණය ද ඉතිරි කරගැනීම, සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමකට ගෙන ඒම, පශු වෛද්‍ය නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් ඉටුකර දී උසස් ව්‍යාප්ති සේවයක් ලබාදීමට කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ජනතාවට පහසුවෙන් ලබා ගැනීම පිණිස බෙදා හැරීමේ කටයුතු විධිමත් කිරීම වැනි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

කිරි නිෂ්පාදනය පමණක් නොව බිත්තර නිෂ්පාදනය ද වැඩිකර ගැනීම සඳහා ගෘහස්ථ මට්ටමෙන් හැකියාවක් හා අවශ්‍යතාවයන් ඇති ජනතාව තෝරාගෙන

ඔවුන්ට අවශ්‍ය දැනුම හා පැටවුන් ලබාදී බිත්තර නිෂ්පාදනය ද වැඩිකර ගැනීමට කටයුතු කරනු ඇත.

මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් රු.මි.139 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

### මිරිදිය ධීවර කර්මාන්තය

මිරිදිය ධීවර මත්ස්‍ය නිෂ්පාදනයන් සඳහා ජනතාවගේ ඉල්ලුම වැඩිවෙමින් පවතී. එබැවින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකර ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා පළාතේ පවතින වැව් හා කාලීන ජලාශයන් හි මිරිදිය මසුන් ඇති කිරීමට හැකියාවක් ඇති හෙයින් ඒවාට මත්ස්‍ය පැටවුන් බහාලීම හා මිරිදිය ධීවරයන්ට අවශ්‍ය උපකරණ සහ පුහුණුව ලබා දී ධීවර මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකරලීම සඳහා රු.මි. 7.0 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

### පරිසර කටයුතු

ගරු සභාපතිතුමනි,

මීට පෙර වර්ෂවලදී මෙම සභාවට ප්‍රකාශ කර ඇති පරිදි පරිසරය සුරැකීම අපහට මෙන්ම ඉදිරි පරපුර සඳහාද වැදගත් වේ. මේ බව වටහාගෙන ඇති අතිගරු ජනාධිපතිතුමා පරිසරය රැකගැනීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඉන් එකක් වන්නේ රටේ භූමි ප්‍රමාණයෙන් වනගහණය 32% ක් දක්වා වැඩි කරගැනීමයි. මෙය ජාතික වැඩසටහනක් ලෙස හඳුන්වා දී ඇති අතර එය "වනරෝපා" ලෙස නම්කර ගම්පලදී ආරම්භ කරන ලදි. මෙම වැඩපිළිවෙල ජලපෝෂක ප්‍රදේශයකින්ම ආරම්භ කිරීම ඉතාමත් යෝග්‍ය කටයුත්තක් බව මම දනිමි. එමෙන්ම එම වැඩසටහන සෑම වර්ෂයකදීම ක්‍රියාත්මක කිරීමටත්, සියලු පාර්ශවයන් සහභාගී කර ගැනීමත් නිසා සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු විය හැක. එමපණක් නොව පරිසරය සුරක්ෂිත කිරීම සඳහා අප විසින් හඳුන්වා දී ඇති විවිධ වැඩසටහන් ඒ ආකාරයෙන්ම නොකඩවා

ක්‍රියාත්මක කිරීමටත් බලාපොරොත්තු වෙමි. ඒ වෙනුවෙන් රු.මි.6.5 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

### කුඩා කර්මාන්ත

මධ්‍යම පළාත තුළ කුඩා පරිමාණ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් සිටී. මොවුන්ගේ නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපල තුළ ඉහළ ඉල්ලුමක් ඇත. මෙම කුඩා කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් සැළසීමත් ඔවුන්ගේ නිෂ්පාදනයන්ට වෙළඳපලක් ලබාදීමට කටයුතු කිරීමත්, නව ව්‍යවසායකයන් හඳුන්වාදීමට කටයුතු කිරීමත්, නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමටත් අපේක්ෂිත අතර සුළු කර්මාන්ත හා හස්ත කර්මාන්තය තුළින් රැකියා උත්පාදනය කිරීමටත් බලාපොරොත්තු වේ. පසුගිය වසර ගණනාවක් තිස්සේම හස්ත කර්මාන්තකරුවන් විශිෂ්ට සම්මාන රාශියක්ම අත්පත් කරගෙන ඇති අතර එය නොකඩවා ඉදිරියට ගෙන යාමටත් අපේක්ෂිතය. එසේම පළාත් සභාව සතු වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලබන්නන්ට විශේෂ ඉල්ලුමක් පවතී. ඉතා හොඳ රැකියාවන් සඳහා ඔවුන් බඳවා ගැනේ. එමනිසා වෘත්තීය පුහුණු ආයතනවල පහසුකම් වැඩි කර දක්ෂ උපදේශකවරුන් බඳවාගෙන තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීමට කටයුතු කරනු ලැබේ. කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා රු.මි. 18 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

### පේෂ කර්මාන්තය

පේෂ කර්මාන්තය සඳහා රටේ විශේෂ ස්ථානයක් මධ්‍යම පළාතට හිමිවේ. නමුත් අපගේ පේෂකර්ම මධ්‍යස්ථානවල අඩුපාඩු රාශියක් දක්නට ලැබෙන අතර, යන්ත්‍රසූත්‍ර ද ඉතා පැරණි ඒවාය. ගොඩනැගිලි හා යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කර උසස් තත්ත්වයේ රෙදිපිළි නිෂ්පාදනය කිරීමටත්, පේෂකාර්මිකාවන්ගේ අවශ්‍යතාවයන් සපුරා ඔවුන්ට ස්ථිර ආදායමක් ලබා ගැනීම තහවුරු කිරීමටත් නව පේෂකාර්මිකාවන් කර්මාන්තයට යොමුකර ගැනීමටත් කටයුතු කරන අතර, දැනට ගබඩා කර ඇති තොග ඉක්මනින් අළෙවි කර ගැනීමටත් කටයුතු කළ යුතුය. මේ සඳහා රු.මි. 10.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

### තරුණ කටයුතු හා වනිතා කටයුතු

පළාතේ තරුණ තරුණියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත් ඔවුන් නොමනා ක්‍රියා කෙරෙහි යොමු නොවීමටත් කටයුතු කර යහපත් පුරවැසියන් බවට පත්කරලීම අප සැමගේ යුතුකමකි. රැකියා නොමැති තරුණ තරුණියන්ට රැකියාවක් සොයාගැනීම සඳහා නිසි වෘත්තීය පුහුණුවක් ලබාදීම, යහපත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම, මත්ද්‍රව්‍යවලට යොමු නොවීම සඳහා කටයුතු කිරීම ඇතුළු තරුණ තරුණියන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට රු.මි. 5.0 ක් ද, පළාතේ තරුණියන්, වනිතාවන් අප සමාජයට විශාල මෙහෙයක් ඉටු කරනු ලබන හෙයින් අපට ඔවුන් ද අමතක කළ නොහැක. ඔවුන්ට නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම සංවර්ධන කටයුතුවලට හවුල් කර ගැනීම පවුලේ ආදායම වැඩිකර ගැනීමට ස්වයං රැකියා කිරීමට පෙළඹවීම, ගෘහස්ථ පාලනය, නොයෙකුත් ආපදාවලට ලක් නොවී ආත්ම ගරුත්වය රැක ගැනීම වැනි කටයුතු පිළිබඳව දැනුවත් කර, පරිපූර්ණ කාන්තා පරපුරක් බිහිකර ගැනීම සඳහා රු.මි. 5.0 ක් වෙන්කර දීමට යෝජනා කරමි.

### ක්‍රීඩා හා ක්‍රිඩා පිටි සංවර්ධනය

පසුගිය වර්ෂවලදී මධ්‍යම පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් ජාතික හා ජාත්‍යන්තර කුසලාන රාශියක් ලබාගෙන රටට විශාල කීර්තියක් අත්පත් කරදී ඇත. ඉදිරියටත් පළාත තුළ ක්‍රීඩාව ඉහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කළ යුතුව ඇත. දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ඔවුන්ට විශේෂ පුහුණුවක් ලබාදීමටත් දෙවන පෙළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පුහුණුවක් ලබාදීමත් කළ යුතු අතර, ශාරිරික ව්‍යායාම සඳහා ජනතාව පෙළඹවීම ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම ආදි කටයුතු වෙනුවෙන් රු.මි. 22.5 ක් වෙන් කරදීමට යෝජනා කරමි.

### පළාත් මාර්ග සංවර්ධනය

පළාත් සභාව සතු C හා D මාර්ග කි.මි. 2244 ක් ඇත. මෙයින් බොහෝමයක් උසස් තත්ත්වයට ගෙන ඒමට හැකිවී ඇතත්, තවත් කි.මි. 1000 කට ආසන්න

ප්‍රමාණයක් දියුණු කළ යුතුව ඇත. විශේෂයෙන් ජාතික මාර්ග පද්ධතිය සමඟ සම්බන්ධතාවය මනාව තහවුරු වන අයුරින් C හා D මාර්ග කාපට් කිරීමත් කාපට් නොකරන මාර්ග තාර හෝ කොන්ක්‍රීට් දැමීමත් C හා D මාර්ගවල ව්‍යුහාත්මක ඉදිකිරීම්වලට හානියක් නොවන පරිදි ගමනාගමනය බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පාලම්, බෝක්කු හා කාණු වැනි යටිතල පහසුකම් ඉදිකිරීමටත්, මෙම මාර්ගවල අලුත්වැඩියාව සහ නඩත්තු වියදම් අවම කරනු වස් කාණු පද්ධතිය හා පැති බැම් සෑදීමටත් කටයුතු කරන අතර මාර්ගවල හා මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු ස්ථානවල පදිකයන්ට ගමන් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමටත් අවධානය යොමු කරමින් රු.මි. 471.3 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## විදුලිබලය

මේ වනවිට විදුලිබලය නොමැති පවුල් ලක්ෂ 2 ක් පමණ රට තුළ වාසය කරයි. අධ්‍යාපනය ලබන දරුදැරියන් සිටින එහෙත් විදුලිබලය නොමැති නිවාස 150,000 ක් පමණ සිටින බව ගණන් බලා ඇත. මේ සියල්ලටම 2016 වසරේදී විදුලිය ලබාදීමට රජය වැඩසටහන් සම්පාදනය කරමින් සිටී. ඒ අනුව මධ්‍යම පළාත තුළ සිටින විදුලිය නොමැති පවුල්වලට ද විදුලිය ලැබෙනු ඇත. එමනිසා අප විසින් කළයුතු වන්නේ විදුලිය සංරක්ෂණය කිරීමත් විකල්ප විදුලි බලය හඳුන්වා දීම විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට දැනුවත් කිරීමත්ය. එමෙන්ම මධ්‍යම පළාතේ සූර්යබලය යොදාගෙන විදුලිය නිපදවිය හැකි පරිසරයක් ඇත. උදාහරණ ලෙස පළාත් සභා සංකීර්ණයේ ඉදි කළ සූර්යබල යෝජනා ක්‍රමය තුළින් මසකට රු.ලක්ෂ 3 කට අධික මුදලක් ඉතිරි කරගැනීමට හැකි වී ඇත. එමනිසා මෙම ක්‍රමය අනෙකුත් විශාල ගොඩනැගිලි සඳහා ද භාවිතා කිරීම වැදගත් වේ. මෙම කටයුතු සඳහා රු.මි.10 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## නිවාස

සෑම පුරවැසියකුටම හිසට සෙවනක් තිබිය යුතු බව අපගේ පිළිගැනීමයි. නිවසක් ඉදිකර ගැනීමට තරම් හැකියාවක් නොමැති ජනතාවට නිවාස ණයක් ලබාගැනීමට කටයුතු සළසා දීමත්, ගොඩනගාගත් නිවසකට ඉතිරි කොටස් නිමකර ගැනීම සඳහා ආධාර කිරීමත්, වහළ සෙවිලි කර ගැනීමට සෙවිලි ආධාර ලබාදීමත් අපගේ යුතුකමක් ලෙස සළකා රු.මි. 9.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## ප්‍රවාහන කටයුතු

පළාතේ ලියාපදිංචි කර ඇති වාහනවලට ආදායම් බලපත්‍ර නිවසේ සිටම ලබාගැනීමට හැකිවන පරිදි වැඩසටහනක් 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදි. ඒ සඳහා අවශ්‍ය උපකරණ මිලට ගෙන මූලික කටයුතු ආරම්භ කරන ලදි. 2016 වර්ෂයේ සිට මෙම ක්‍රමය ක්‍රියාත්මක වන හෙයින් වාහන හිමියන්ට ඉතා පහසුවෙන් කාලය ඉතිරි කරගෙන ආදායම් බලපත්‍ර ලබාගැනීමට හැකිවනු ඇත.

එසේම ප්‍රවාහන අංශය මගින් කළ යුතු තවත් එක් වැදගත් කාර්යයක් වන්නේ මාර්ග තදබදය අඩු කිරීමත්, මාර්ග අනතුරු අවම කර ගැනීමත්, මගී ජනතාවට විශ්වාසනීය ප්‍රවාහන සේවාවක් ලබාදීමට හැකිවන පරිදි කටයුතු කිරීමත්ය. ප්‍රධාන නගරවල මෙන්ම උප නගරවලද බස් නැවතුම් පොලවල් ඉදි කර මහජනතාවට පහසුවක් සළසාදීමට කටයුතු කරන අතර, විශේෂයෙන්ම පාසැල් දරුවන් ප්‍රවාහනය කරනු ලබන වෑන් සහ බස් රථ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර දරුවන්ගේ රැකවරණය සළසාදීමට කටයුතු කිරීමටත් බලාපොරොත්තු වේ. මේ සඳහා රු.මි. 17.0 ක් වෙන් කර දීමට යෝජනා කරමි.

## ප්‍රධාන ලේකම් කාර්යාලය

ගරු සභාපතිතුමනි,

ගරු මන්ත්‍රීතුමන්ලා වෙත මහජනතාවගෙන් ලැබෙන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා විමධ්‍යගත අයවැය යටතේ රු.මි. 148 ක් එනම් මන්ත්‍රීතුමන්ලාට රු. ලක්ෂ

25 බැගින් ලබාදීමට යෝජනා කරන අතර, පළාත තුළ අඩු සංවර්ධනයක් පවතින ප්‍රදේශ තෝරා එම ප්‍රදේශවල සංවර්ධනය සඳහාත් පළාතේ ආදායම වැඩිකර ගැනීම සඳහාත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කිරීම වෙනුවෙන් රු.මි. 15 ක් ද, පළාතේ අඩු සංවර්ධනයක් දක්නට ලැබෙන ප්‍රදේශවලට අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීම සඳහා රු.මිලියන 100 ක් ද වෙන් කර දීමට යෝජනා කරමි. එසේම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමටත් දීප ව්‍යාප්ත රාජ්‍ය සේවයේ අනිවාර්යෙන්ම සමත් විය යුතු විභාග සඳහා එම විභාග ගාස්තු ගෙවීමටත් රු.මි. 35 ක් වෙන් කර දීමට යෝජනා කරමි. පළාතේ වාහන බලපත්‍ර නිකුත් කිරීම සහ සහ වෙනත් ආදායම් රැස්කිරීමේ කටයුතු කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගිනි. ඒ සඳහා ඔවුන්ට ලබා දී ඇති පරිගණක ඉතා පැරණි ඒවා වන හෙයින් ක්‍රමිකව ඒවාට නව පරිගණක ලබාදීමටත් ඔවුන් විසින් පළාත් භාණ්ඩාගාරයට එවිය යුතු මාසික වාර්තා ලබා ගැනීම සඳහාත් එම ගිණුම්කරන කටයුතු ක්‍රමානුකූලව කිරීම සඳහාත් රු.මි. 2 ක් වෙන් කර දීමටත්, පසුගිය වර්ෂයේ දී කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන සඳහා මාසිකව ගෙවිය යුතු වාරික ගෙවීම් සඳහාත් රු.මි. 122 ක් වෙන් කිරීමට යෝජනා කරමි. එමෙන්ම පසුගිය වර්ෂයේ දී රාජ්‍ය නිලධාරින් සඳහා ඉදිකළ නිල නිවාසවල ඉතිරිවැඩ නිම කිරීම සඳහා රු.මි. 5 ක් වෙන් කර දීමටත් යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි,

පළාතේ පවතින කාලගුණික හා දේශගුණික තත්ත්වයන් යටතේ නොයෙක් ආකාරයේ විපත්වලට මධ්‍යම පළාත ගොදුරු වන බව පසුගිය අත්දැකීම් අනුව අපට පැහැදිලි වේ. විශේෂයෙන්ම නාය යෑම්, ගිනි ගැනීම්, ගං වතුර ජල හිඟය ආදි විපත්ති සිදුවූවිට මහජනතාවට අවශ්‍ය සේවාවන් ලබාදීම සඳහා පළාතේ අමාත්‍යාංශ පහ සඳහාම රු.මි. 1.5 බැගින් වෙන් කරදීමට යෝජනා කරමි.

**මත් ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම**

මත් ද්‍රව්‍ය භාවිතය නිසා ජනතාව රෝගීන් වනවා පමණක් නොව එමගින් රටේ ශ්‍රම බලකායට ද හානියක් සිදුවේ. එම රෝගීන් සුව කිරීමට රජයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට ද සිදුවේ. නමුත් අප රටේ ක්‍රියාත්මක නිදහස් සෞඛ්‍ය සේවය නිසා එය ජනතාවට නොතේරේ. එමනිසා ජනතාව දැනුවත් කර

මත් ද්‍රව්‍ය භාවිතය අඩු කළ යුතුය. උපදේශන තුළින් ඔවුන් දැනුවත් කිරීම මගින් යම්කිසි ප්‍රමාණයකට හෝ අපගේ අරමුණ ඉටුකරගත හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි, එපමණක් නොව ගංජා, අබිං, හෙරොයින් වැනි අන්තරායකර ඖෂධ අළෙවි කරන හා බෙදාහරින ජාවාරම්කාරයින් නීතියේ රැහැනට හසුකර ගැනීමට කටයුතු කළ යුතුය. අප සියළු පාර්ශවයන් එකට එකතු වී උනන්දුවෙන් කටයුතු කළහොත් මෙය අපහසු කටයුත්තක් නොවන බව මම විශ්වාස කරමි.

අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය සමඟ සම්බන්ධ වී පාසැල් දරුවන්ගේ පටන් සියළු පාර්ශවයන් සමඟ ඒකරාශී වී මත් ද්‍රව්‍ය උවදුර අවම කර ගැනීමට කටයුතු කිරීම අපගේ අරමුණ වේ. මෙමගින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගැනීමත් නිරෝගි ජනතාවක් බිහිකර ගැනීමටත් පවුලේ සමගිය තහවුරු කර ගැනීමටත්, තමන් උපයන ආදායම ඵලදායි ලෙස වැය කිරීමටත් හැකිවනු ඇත. මේ සඳහා අප සැවොම අපට හැකි ආකාරයෙන් ක්‍රියා කිරීමට ඉදිරිපත් වෙමුයි ඉල්ලා සිටිමි.

**කළමනාකරණය හා පරිපාලනය**

ගරු සභාපතිතුමනි,

පළාත් සභාවේ පරිපාලන වියදම් වශයෙන් විශාල මුදලක් දරණු ලැබේ. ඊට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් ඉතා සුළුය. සේවක පඩිනඩි වශයෙන් දරන වියදම් අඩු කළ නොහැක. එහෙත් විදුලිය, ඉන්ධන වෙනුවෙන් කරනු ලබන වෙන් කිරීම් කළමනාකරණය කළ හැක. අනවශ්‍ය ලෙස වැයවන වියදම් හොඳින් පරිපාලනය කරන්නේ නම් ඉතා වැදගත්ය. එමෙන්ම ප්‍රාග්ධන වියදම් වශයෙන් ඉතා විශාල ප්‍රමාණයක් වෙන්කර දී ඇති හෙයින් මෙමගින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට නම් කලින්ම යෝජනා තෝරාගෙන ඇස්තමේන්තු කර සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන කලින්ම වැඩ ආරම්භ කරන්නේ නම් වසර තුළදීම නිමකර මහජනතාවට සේවය කිරීමට හැකිවනු ඇත. ඇත්ත වශයෙන්ම සුදුසු යෝජනා තෝරා නොගැනීම නිසා වර්ෂය අවසානය වන විට ඒවා සංශෝධනය කර කුමන හෝ යෝජනාවක් ඉටු කර මුදල් වැය කිරීමට ඇතැම්

ආයතන පුරුදු වී ඇත. මෙමගින් මහජනතාවට උපරිම සේවයක් සිදුවේද යන්න සැක සහිතය. මෙම ක්‍රමයන් ඉදිරියේදී නොකිරීමට ආයතන ප්‍රධානීන් වගබලා ගැනීම ඉතා වැදගත් බව අවධාරණය කරමි. තවද වර්ෂ අවසානය වන විට බිල්පත් ඉදිරිපත් කිරීමට බලා සිටීම නිසා පළාත් භාණ්ඩාගාරයට ගැටළුවලට මුහුණපෑමට සිදුවේ. එමනිසා කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර වර්ෂය ආරම්භයේ සිටම බිල් ගෙවීම් කිරීමට හැකිවන පරිදි බිල්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.

පසුගිය වසරේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී ද මා විසින් පෙන්වා දුන් කරුණක් වන්නේ පළාත් සභාව සතු ගොඩනැගිලි ප්‍රමාණයන් තවමත් ප්‍රයෝජනයට නොගෙන දිරාපත් වෙමින් පවතින බවය. එහෙත් තවම යම්කිසි ගොඩනැගිලි ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන පවතින බව පෙනේ. එමනිසා ඒ ඒ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු සතු එවැනි ගොඩනැගිලි හඳුනාගෙන ප්‍රධාන ලේකම් වෙත භාරදීමටත් කටයුතු කරණ ලෙස ඉල්ලා සිටින අතර මෙම වර්ෂයේදී අත්‍යාවශ්‍යතාවය මත පමණක් ඉදිකිරීම් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු විපක්ෂනායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි,

මෙතෙක් වේලා මා විසින් ඉදිරිපත් කරන ලද්දේ මහාභාණ්ඩාගාරය විසින් අප වෙත ලබාදෙන ප්‍රදානයන් පළාතේ සංවර්ධන කටයුතු සඳහා බෙදාදීමට යෝජිත ආකාරයයි. මෙම ප්‍රතිපාදන ප්‍රමාණයන් ඒ ඒ දෙපාර්තමේන්තු විසින් මහජනතාවට ලබාදීමට අපේක්ෂා කරන හා මහජනතාවගේ ඉල්ලීම් සපුරාලීමට ප්‍රමාණවත් නොවන බවත් මම දනිමි. එහෙත් අපවෙත ලැබෙන සීමිත සම්පත් ප්‍රමාණය මත වෙනත් ආකාරයට බෙදාහැරීමට නොහැකි වේ. එසේ වුවද මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යංශ මගින් ද අප පළාත් සභාවට මුදල් ලැබෙනු ඇත. එම මුදල් සඳහා ද ක්‍රියා කළ යුතු වන්නේ අප පළාත් සභාවේ නිලධාරීන් විසින්මය. එසේම අප පළාත් සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු විශේෂ යෝජනා ඇතොත් ඔවුන්ට ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබාගැනීමේ හැකියාවක් ද ඇත. ඒ පිළිබඳවද අපගේ අවධානය යොමු කළ යුතුය.

ගරු සභාපතිතුමනි,

ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර වෙන්කර ඇති මුදල් කිසිවක් අපතේ නොයවා මහජනතාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික සුහසාධනය ඉහළ නැංවිය හැකි යෝජනා හඳුනාගෙන ක්‍රියාත්මක කර පළාතේ දළ ජාතික නිෂ්පාදනය මෙන්ම රටේ දළ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමට අප සෑමදෙනාම උත්සාහ කළ යුතු බව මම අවධාරණය කරමි.

එමෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන මා මුලින් සඳහන් කළ මහනුවර නගර සංවර්ධනය, වකුගඩු රෝගය තුරන් කිරීම, මත්ද්‍රව්‍ය පාලනය හා වස විසෙන් තොර දේශීය ආහාර නිෂ්පාදනය සහ පරිසරය සංරක්ෂණය, වන වගාව ව්‍යාප්ත කිරීම යන වැඩසටහන් සඳහා ද මෙම ගරු සභාවේ සියළුදෙනාත් පළාත් සභාවේ සියළු නිලධාරීනුත් එකමුතුව එක්සත්ව සහයෝගය ලබාදී එම වැඩසටහන්හී අවසාන ප්‍රතිඵලය අත්කර දීමට එකමුතුව අවශ්‍ය කටයුතු ඉටුකර දෙමු යැයි ඉල්ලා සිටිමි.

ගරු සභාපතිතුමනි

අප පළාත් සභාවේ කටයුතු කෙරෙහි උනන්දුව දක්වා නිසි අනුශාසනා ලබා දෙමින් කටයුතු කරන අති ගරු මහ නායකහිමිවරුන් ඇතුළු සියළු ආගමික නායකවරුන් වෙත මාගේ නමස්කාර පූර්ව ස්තූතිය මුලින්ම පිරිනමමි.

එසේම අපගේ පළාත් සභාවේ කටයුතු කෙරෙහි පළාතේ දියුණුව වෙනුවෙන් නිරන්තරව සොයා බලා උපදෙස් ලබාදෙන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමි. එමෙන්ම පළාත් සභාවේ කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් අපව නිවැරදි මාවත කරා යොමු කරන ගරු ආණ්ඩුකාරවර සුරංගනි එල්ලාවල මැතිතුමියට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි. එසේම පළාත් සභාවේ  කටයුතු  අපක්ෂපාතීව ඉටු කරනු ලබන ගරු සභාපතිතුමාටත් නියෝජ්‍ය සභාපතිතුමාටත්, ගරු අමාත්‍යමණ්ඩලයටත් මාගේ

කෘතඥතාපූර්වක ස්තූතිය පිරිනමමි. එසේම පළාත් සභාවේ කටයුතු කිරීමේ දී අපගේ අඩුපාඩු පෙන්වාදෙමින් නිවැරදි දිශානුගතව ගමන් කිරීමට අදහස් පෙන්වා දෙමින් කටයුතු කරන ගරු විපක්ෂනායකතුමාට සහ ගරු මන්ත්‍රී මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමමි.

පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරින් මෙහෙයවෙමින් මූල්‍ය කළමනාකරණය, සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බලමින් අඩුපාඩු නිවැරදි කරමින් කටයුතු කරන ප්‍රධාන ලේකම්තුමා, ආණ්ඩුකාර ලේකම්තුමා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය, අමාත්‍යාංශ ලේකම්තුමන්ලා, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමන්ලා, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ සියළුම රාජ්‍ය නිලධාරින් වෙත මාගේ කෘතඥතාව පිරිනමමි. මධ්‍යම පළාත් සභා ලේකම්, සහකාර ලේකම් ඇතුළු සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන සුවිශේෂි සේවය අගයමින් ඒ සියළු දෙනාටත් මාගේ ස්තූතිය පිරිනමමි.

එසේම පළාත් සභාවේ සංවර්ධන කටයුතු බොහෝමයක් ඉටු කරනු ලබන ගරු නගරාධිපතිවරුන්, ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දිස්ත්‍රික් ලේකම්වරුන් තිදෙනා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩලවලට මාගේ ස්තූතිය පිරිනමමි.

පළාත් සභාවේ කටයුතු පිළිබඳව මහජනයාට දැනගැනීමට සැලැස්වීම පිළිබඳව දක්වන සහයෝගයට සියළු මාධ්‍යවේදී හිතවතුනට මාගේ ස්තූතිය පිරිනමමි. අපගේ ආරකෂාව සළසමින් කරනු ලබන සේවය වෙනුවෙන් කුණ්ඩසාලේ පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු සියළු ආරක්ෂක නිලධාරීන්ට මාගේ කෘතඥතාව පිරිනමමි.

අවසාන වශයෙන් පළාත් සභාවේ ඉදිරි කටයුතු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමි.

**ඔබ සැමට දළදා සම්දු පිහිටයි**

සරත් ඒකනායක

ප්‍රධාන අමාත්‍ය

මධ්‍යම පළාත